# සංචාරක ව්‍යාපාරය කෙරෙහි අලි පරපුර දක්වන දායකත්වය

**එන්.එම්.ඒ.එන් මධුසංඛ/ ඒ.එම්.එම්.සී අත්තනායක ***

ඈත අතීතයේ සිටම විදේශිකයින් ශ්‍රී ලංකාවට පැමිණි බව සනාථ කළ හැකි කරුණු රැසක් ඓතිහාසික මූලාශ්‍රයන්ගෙන් සොයාගත හැකිය. ඒ අනුව වර්තමානයේ විදේශිකයින්ගේ පැමිණීම කර්මාන්තයක් දක්වා වර්ධනය වී තිබේ. අධ්‍යාත්මික සුවය, ස්වභාව සෞන්දර්යයෙන් ලබන වින්දනය, විවේකය, ඓතිහාසික වටිනාකම් ආදී වූ කරුණු පිළිබඳව අවධානය යොමු කරමින් මෙරටට පැමිණෙන විදේශිකයන් සංචාරකයින් ලෙස සරලව හැඳින්විය හැකිය. මෙරට සංචාරක කටයුතු කර්මාන්තයක් වශයෙන් වැඩී, වර්ධනය වන්නේ 1960 දශකයේ සිටය. අලියා යනු ගොඩබිම වෙසෙන විශාලම සත්ත්වයා වේ. වඳ වී යාමේ තර්ජනයට ලක්ව ඇති සත්ත්වයකු ලෙස ද ආසියානු අලියා ලෝක සංරක්ෂණ සංගමය රතු දත්ත ලේඛනයට පවා ඇතුලත් කොට ඇත. අලි ගහණය බොහෝවිට අභය භූමිවලට පමණක් සීමා වී තිබේ. විල්පත්තු, මින්නේරිය, යාල, උඩවලව අලින් වැඩි වශයෙන් දැකගත හැකි ස්ථානයන් ය.

සංචාරක කර්මාන්තය සහ අලියා අතර පවතින්නේ සුවිශේෂී බැඳියාවකි. එය ඈත අතීතය දක්වා දිව යයි. සංචාරකයින් මෙරටට ගෙන්වාගත හැකි ප්‍රධාන දිශානතීන් කිහිපයක් පවතී. පෙරහැර සංස්කෘතිය, ස්වභාවික සෞන්දර්යය, ප්‍රචාරණය අරමුණු කරගනිමින් නිර්මාණය කළ වීඩියෝ පට, දේශීය විලාසිතා සංස්කෘතිය ඒ අතුරින් ප්‍රධාන වේ. මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ ශ්‍රී ලාංකේය සංචාරක ව්‍යාපාරය තුළ අලියා භාවිතා කරන්නේ කෙසේද යන්න පිළිබඳව අධ්‍යයනය කිරීම සහ සංචාරක ව්‍යාපාරය හේතුකොට ගෙන අලි පරපුර කෙරෙහි වන බලපෑම අධ්‍යයනය කිරීමයි. ඒ අනුව අහඹු ස්තරායන නියැදිය ඔස්සේ ප්‍රධාන සංචාරක දිශානතීන් හතරක් පදනම් කරගනිමින් 2015 ජනවාරි මාසයේ සිට 2016 ජනවාරි මාසය දක්වා වසරක කාලයක් තුළ මෙරට සංචාරක ව්‍යාපාරය කෙරෙහි අවධානය යොමු කරමින් සම්මුඛ සාකච්ඡා සහ අන්තර්ගත විශ්ලේෂණය ඔස්සේ දත්ත විශ්ලේෂණය සිදු කරන ලදී.

පර්යේෂණය අවසානයේ මෙරට සංචාරක කර්මාන්තයේ ප්‍රවර්ධනය උදෙසා අලියා සෘජු බලපෑමක් එල්ල කරන ලද බව තහවුරු විය. ඊට අමතරව සංචාරක කර්මාන්තය උදෙසා අලියා භාවිතා කිරීම විධිමත් හා අවිධිමත් ලෙස සිදු කරන බවත්, අවිධිමත් ආකාරයට අලියා භාවිතා කිරීමේදී අලින් පීඩාවන්ට ලක්වී අලින්ගේ නිදහසට බලපෑමක් එල්ලවන බවද සොයාගත හැකි විය. ඒ අනුව මෙරට සංචාරක කර්මාන්තයේ ප්‍රවර්ධනය උදෙසා අලියා විධිමත් ආකාරයෙන් භාවිත කිරීමත්, සංචාරක කටයුතු කෙරෙහි අලියා දායක කරගන්නා විට බලපවත්වන නීති සහ රෙගුලාසි පද්ධතියක් ඇති කිරීමත් යන කාරණාවන් යෝජනා වශයෙන් ඉදිරිපත් කළ හැකිය. මෙය රටක් වශයෙන් තිරසාර සංවර්ධනයක් කරා යන ගමනේදී එය මහඟු පිටිවහලක් වනු නොඅනුමාන ය.

**මූඛ්‍ය පද :- සංචාරක ව්‍යාපාරය, අලියා, බලපෑම, දායකත්වය, ප්‍රවර්ධනය**

---

*** සහකාර කථිකාචාර්ය, ජනසන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය.**